සමාජයේ සිදුවන යම් වැරදි පිළිබඳව වාර්තා කිරීමේදී, ඊට අදාළ නොවූවත් එම වැරදි වලට සම්බන්ධ සැකකරුවන්ගේ/වරදකරුවන්ගේ වාර්ගිකත්වය සඳහන් කිරීම ඇතැම් මාධ්‍ය මගින් සිදුකෙරෙන වරදක් ලෙසින් දැක්විය හැක. එසේම බොහෝ විට මෙසේ විශේෂයෙන් දැක්වෙන්නේ බහුතර වාර්ගිකත්වයන් නොව වෙනත් වාර්ගිකත්වයන් බවද නිරීක්ෂණය කළ හැක.
දෙස් විදෙස් මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුව, මෙම භාවිතාව මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කිරීමක් වෙයි. යම් පුවතකට ඍජුවම අදාළ නොවන්නේ නම් අයෙකුගේ වාර්ගිකත්වය සඳහන් නොකළ යුතු බව එම මාධ්‍ය ආචාර ධර්මයන්හි දැක්වේ.
එකම පුවතක් මෙම මාධ්‍ය ආචාර ධර්මය උල්ලංඝනය වන ලෙසින් සහ නොවන ලෙසින් වාර්තා කර තිබෙන ආකාරය අපට මෙසේ දැක්විය හැක. මෙම සිදුවීමේ සැකකරු "මුස්ලිම් ජාතික" වෛද්‍යවරයෙකු බව දිවයින (07/12) වාර්තා කරන අතර, එම සැකකරු වෛද්‍යවරයෙකු බව පමණක් ලංකාදීප (07/12) වාර්තා කරයි.
එසේ නම්, මෙහිදී දිවයින පුවත්පත මගින් වාර්ගිකත්වය අදාළ නොවන තැනක ඉදිරිපත් කරමින් මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් සිදුකර තිබේ. එය වගකීම් සහගත මාධ්‍යකරණය නොවන බවද අපට පැවසීමට සිදුවේ.
#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Lankadeepa